නාවික හමුදා මූලස්ථානය
නාහ 5 කොළඹ 01

බෙදාහැරීම බලන්න 2002 සැප්තැම්බර් මස 26 වන දින

**<u>සංදේශය</u>**

**<u>නාවික පුද්ගලයින්ගේ සම්පූර්ණ මාසික වැටුප බැංකු ගිණුම් මගින් පමණක් ගෙවීමට කටයුතු කිරීම</u>**

1. සියළුම නාවික හමුදා පුද්ගලයින්ගේ සම්පූර්ණ මාසික වැටුප් හා දීමනා ඔවුන් විසින් ස්වකීය අභිමතය පරිදි විවෘත කරනු ලබන බැංකු ගිණුමක් තුලින් පමණක් ගෙවීමට තීරණය කර ඇත. මෙම ක්‍රමය 2003 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන අතර, දැනට ගිණුම සඳහා සිය වැටුප බැර නොවන නාවික පුද්ගලයින් විසින් තම නමින් බැංකු ගිණුමක් විවෘත කර එහි තොරතුරු ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (වැටුප් හා විශ්‍රාම වැටුප්) වෙතින් සපයනු ලබන ආකෘති පත්‍රයට අනුව පුරවා අදාළ බැංකු කළමණාකරු සහතික කර අදාළ අණදෙන නිලධාරි මගින් නාවික වැටුප් අංශය වෙත ඉදිරිපත් කළ යුතු අතර, තමන්ගේ අවශ්‍යතාවය පරිදි උපරිම වශයෙන් බැංකු 03ක් සඳහා මුදල් බැරකිරීමේ පහසුකමද සළසා ඇත.

2. නාවික පුද්ගලයින් සිය ගිණුම විවෘත කිරීම සඳහා බැංකු ශාඛාවක් තෝරාගැනීමේදී අන්තර් බැංකු පරිගණක ජාලය හා සම්බන්ධ වී ඇති ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ප්‍රධාන වාණිජ බැංකු ශාඛාවක් තෝරාගැනීමට සැලකිලිමත් විය යුතු අතර, ඒ මගින් අත්වන පහත සඳහන් වාසි කෙරෙහි අවධානය යොමුකළ යුතුවේ.

අ. නාවික වැටුප් අංශය වෙතින් වැටුප් ගෙවීමට නියමිත දිනටම තමතමන්ගේ ගිණුම සඳහා මුදල් බැරවීම.

ආ. එම බැංකු ගිණුම සඳහා බැංකු වෙතින් ලබාදෙන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳ හා වන කාඩ්පත් මගින් කිසිදු අපහසුවකින් තොරව තමන්ගේ අවශ්‍යතාවය පරිදි මුදල් ලබාගැනීමට ඇති හැකියාව.

ඇ. අන්තර් බැංකු පරිගණක ජාලය හා සම්බන්ධ වී ඇති බැංකු සඳහා සැලසෙන අනෙකුත් සියළු වාසි.

3. මෙවැනි පහසුකම් සහිත ප්‍රධාන වාණිජ බැංකු 25 ක ශාඛා 1042 ක් ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්තව ඇති අතර, එම බැංකු හා එහි ශාඛා සියල්ලේම පහත සඳහන් විස්තර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (වැටුප් හා විශ්‍රාම වැටුප්) විසින් ප්‍රාදේශීය බලධාරීන්/ආයතන අණදෙන නිලධාරීන් වෙත එවනු ඇත.

අ. බැංකු ශාඛාවේ නම සහ ලිපිනය
ආ. බැංකු ශාඛාවේ දුරකථන අංකය සහ ෆැක්ස් අංකය
ඇ. බැංකු සංකේත අංකය සහ බැංකු ශාඛා සංකේත අංකය

4. බැංකු අන්තර් පරිගණක ජාලය හා සම්බන්ධවී නොමැති ග්‍රාමීය බැංකු, සංවර්ධන බැංකු හා වෙනත් ප්‍රාදේශීය බැංකු සහ ඒවායේ ශාඛා සිය ගිණුම විවෘත කිරීම සඳහා තෝරාගන්නේ නම් පහත සඳහන් අපහසුතාවලට මුහුණදීමට සිදුවිය හැක.

අ. එවැනි බැංකු ගිණුම් වෙත මුදල් යැවීම පරිගණක භාවිතයකින් තොරව අනුගමනය කරන සංකීර්ණ ක්‍රියාවලියක් තුලින් සිදුවන හෙයින් වැටුප් දින සිට දිගු ප්‍රමාදයකින් පසුව අදාල ගිණුම සඳහා මුදල් බැරවීම.

ආ. නවීන තාක්ෂණය හා සම්බන්ධව නොමැති එවැනි බැංකු සමග ගනුදෙනු කිරීමේදී සම්ප්‍රදායික ක්‍රම අනුගමනය කිරීමට සිදුවීම නිසා ප්‍රමාදවීම හා කලහැකි ගනුදෙනු සීමාසහිත වීම.

ඇ. එවැනි බැංකු සමග නාවික හමුදා මූලස්ථානය කටයුතු කරනුයේ තැපැල් මගින් පමණක් බැවින්, චෙක්පත් කල් ඉකුත්වීම, තැපෑලේදී සිදුවන ප්‍රමාද හා අස්ථානගතවීම හේතුවෙන් අත්විදීමට සිදුවන අපහසුතා.

**5**. දැනට රු **100.00** ක් පමණක් මුදල් ලෙස ලබාගෙන ඉතිරි සම්පූර්ණ වැටුප බැංකු ගිණුමක් වෙත බැර වන නාවික පුද්ගලයින්ගේ වැටුප ඔවුන් විසින් යම්කිසි වෙනසක් කිරීම සඳහා ඉල්ලා නොසිටින්නේ නම් ඉදිරියටද සම්පූර්ණ වශයෙන් එම ගිණුමට බැරකිරීමට කටයුතු කෙරේ. වැටුපෙන් කොටසක් පමණක් බැංකු ගිණුමකට බැරවන පුද්ගලයින්ගේ වැටුපද ඔවුන් විසින් වෙනස්කමක් කිරීමට ඉල්ලා නොසිටින්නේ නම් සම්පූර්ණයෙන්ම එම ගිණුමට බැරකිරීමට කටයුතු කෙරේ. එසේම වැටුපෙන් කොටස් දෙකක් බැංකු ගිණුම් දෙකකට බැරවී මුදල් වශයෙන් ද යම් කොටසක් ලබාගන්නා නාවික පුද්ගලයින් විසින් එසේ මුදල් වශයෙන් ලබාගන්නා කොටස ඉදිරියේදී බැරවිය යුත්තේ තමන්ගේ කුමන ගිණුමටද යන්න ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී (වැටුප් හා විශ්‍රාම වැටුප්) වෙත දැනුම්දිය යුතුය. මෙම ඡේදයේ දක්වා ඇති සියළුම වර්ග කිරීම් වලට ඇතුලත් නාවික පුද්ගලයින් හට තමන් දැනට පවත්වාගෙන යන බැංකු ගිණුම් අන්තර් බැංකු පරිගණක ජාලය හා සම්බන්ධ වී නොමැති නම් එම ගිණුම වෙනුවට අන්තර් බැංකු පරිගණක ජාලය හා සම්බන්ධ බැංකු ශාඛාවන් හි ගිණුම විවෘත කර ඉහත පළමු වැනි ඡේදයේ පරිදි එම දත්තයන් ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී (වැටුප් හා විශ්‍රාම වැටුප්) වෙත ඉදිරිපත් කල හැක. දැනට තමන් ලබාගත් ණය මුදලක වාරික ගෙවීම සඳහා පමණක්ම පවත්වාගෙන යන ගිණුම වෙනුවෙන් මුදල් බැර කිරීම නාවික වැටුප් අංශය වෙතින් ඉදිරියටද කරනු ලැබේ.

**6**. ඉහත දක්වා ඇති පරිදි සියළුම නාවික පුද්ගලයින්ගේ මාසික වැටුප් හා දීමනා සම්පූර්ණයෙන්ම බැංකු ගිණුමක් මගින් පමණක් ගෙවීමේදී එම පුද්ගලයින් හට අත්වන වාසි වලට අමතරව එම පුද්ගලයින් අනුයුක්ත නෞකා හා ආයතන වෙත පහත සඳහන් වාසිද අත්වේ.

අ. ආයතන හා නෞකාවන්හිදී නාවික පුද්ගලයින්ගේ මුදල් අස්ථානගතවීම වැනි විෂමතා අවම වීම.

ආ. මාසික වැටුප් හා දීමනා සඳහා ලැබෙන අතිවිශාල මුදල් ප්‍රමාණය ප්‍රවාහනය කිරීම, වෙන්කිරීම හා සේප්පු තුල තබාගැනීම යන කටයුතු වලදී මුහුණදෙන අවදානම නොමැති වීම.

ඇ. වැටුප් ගෙවීම සඳහා මිඩංගු කරන කාලය වෙනත් ඵලදායී කටයුතු සඳහා යෙදවිය හැකිවීම.

ඈ. වැටුප් ලැබීමෙන් පසු නාවික පුද්ගලයින් හට නිවෙස් කරා යාමට ඇති අවශ්‍යතාවය නැතිවීම.

ඉ. නාවික පුද්ගලයින් ස්ථාන මාරුවීම වැටුප් සඳහා බලපෑමක් නැතිවීම.

**7**. සම්පූර්ණ මාසික වැටුප බැංකු ගිණුමක් තුලින් ගෙවීමට කටයුතු කිරීමෙන් පසුව එම මාසයට අදාල වැටුප් ලැයිස්තු හා පත්‍රිකා ආයතන හා නෞකා වෙත එවීමට කටයුතු කරන අතර, එම වැටුප් පත්‍රිකා අදාල නාවික පුද්ගලයන් වෙත භාර දී වැටුප් ලැයිස්තුව ඔවුන් වෙතින් නිසි ලෙස අත්සන් කරවා නැවත ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී (වැටුප් හා විශ්‍රාම වැටුප්) වෙත එවීමට අණදෙන/අණභාර නිලධාරීන් වග බලා ගත යුතුය.

**8**. තවද බැංකු කටයුතු කෙරෙහි වැඩිදුර පැහැදිලි කිරීමක්/අවබෝධයක් අවශ්‍ය නාවික පුද්ගලයින් වෙතොත් ඔවුන්ව දැනුවත් කිරීමට අණදෙන/අණභාර නිලධාරීන් විසින් කටයුතු කලයුතු අතර සිය අවශ්‍යතාවයනට අනුව බැංකු ගිණුම විවෘත කිරීම හා විවිධ අවශ්‍යතා බැංකු මගින් ඉටුකරගත හැකි ආකාරය ඔවුනට පැහැදිලි කල යුතුය.

උදා:

අ. බද්ධ ගිණුමක් විවෘත කිරීම මගින් සිය ළඟම ඥාතියෙකුට හෝ තමන් කැමති පුද්ගලයෙකු හට සිය ගිණුමෙන් මුදල් ලබාගැනීමට සැලැස්වීමේ හැකියාව මෙහිදී ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ද භාවිතා කළ හැකිවේ.

ආ. යම්කිසි මුදල් ප්‍රමාණයක් වෙනත් අයෙකුට ගැනීමට සැලැස්වීමට අවශ්‍ය නාවික පුද්ගලයෙකු වේ නම් ඔහුට එම බාහිර පුද්ගලයා මගින් වෙනත් ගිණුමක් විවෘත කර අවශ්‍ය මුදල පමණක් එම බාහිර පුද්ගලයාගේ ගිණුමට මාසිකව බැර කරන ලෙස සිය බැංකුවට ස්ථාවර නියෝග නිකුත් කිරීමට ඇති හැකියාව.

ඇ. තමන්ගේ වැටුප බැර වන බැංකුවට අමතරව වෙනත් බැංකුවකින් ණය ගැනීමක් වෙනුවෙන් හෝ වෙනත් බැංකුවක වෙනත් අයෙකුගේ ගිණුමකට මාසිකව මුදල් යැවීමට අවශ්‍ය වන්නේ නම් එය තම බැංකු ගිණුම ඇති බැංකුව වෙත ස්ථාවර නියෝගයක් නිකුත් කරමින් කළහැකි බව යනාදිය.

9. එසේම නාවික හමුදා පුද්ගලයින්ගේ සම්පූර්ණ වැටුප් හා දීමනා ඔවුන්ගේ බැංකු ගිණුම් වලට බැර වීමේදී නොපැමිණියෙකු ලෙස සටහන් කරනු ලබන නැවියන්ගේ වැටුප් එම ගිණුම් වලට බැරවීම වළක්වාගැනීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදා නියෝග 0505 සහ නාවික පොදු 012010 ඔක්තෝබර් 2002 සංඥාව ප්‍රකාර අදාල නැවියන්ගේ නොපැමිණි කාලය දින 07 සම්පූර්ණ වනවාත් සමගම ජ්‍යේෂ්ඨ මාණ්ඩලික නිලධාරි (වැටුප් හා විශ්‍රාම වැටුප්) හට පිටපතක් සහිතව නොපැමිණීම සටහන් කිරීම සඳහා නාවික හමුදා මූලස්ථානය වෙත අයදුම්කිරීමට අණදෙන/අණභාර නිලධාරීන් තරයේ වග බලා ගත යුතු වේ. එසේ කිරීමට යම් හෙයකින් අතපසුවීම හෝ ප්‍රමාදවීමෙන් එම පුද්ගලයින්ගේ ගිණුම් වලට මාසික වැටුප බැර වන අතර, එම මුදල් ඔවුන් විසින් නියමිත දිනයේදීම බැංකුව වෙතින් ලබාගෙන ඇත්නම් ඒවා ආපසු ගෙන්වාගැනීම කළ නොහැකි අතර, එහි වගකීම අදාල අණදෙන/ අණභාර නිලධාරීන්ට පැවරෙනු ඇත.

10. ඉහත ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා ප්‍රාදේශීය බළධාරීන්/ආයතන/නෞකා යාත්‍රා අණදෙන නිලධාරීන් විසින් උනන්දුවකින් කටයුතු කරන මෙන් දන්වන අතර ගැටළු සහගත තත්ත්වයන් ජ්‍යේෂ්ඨ මාණ්ඩලික නිලධාරි (වැටුප් හා විශ්‍රාම වැටුප්) වෙතින් නිරාකරණය කරගත යුතු වේ.

11. ලද බව දන්වන්න.

ඩබ්ලිව්කේ සඳගිරි, වීඑස්වී, යූඑස්පී,ආර්සීඩීඑස්,පීඑස්සී
වයිස් අද්මිරාල්
නාවික හමුදාධිපති

බෙදාහැරීම: සම්පූර්ණ

නම ..................................
ආයතනය/නෞකාව ...............
.........................................

ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (වැටුප් හා විශ්‍රාම වැටුප්)
ශ්‍රීලංනානෞ 'ගැමුණු'
වැලිසර

2002 ..................................

__බැංකුව වෙත මුදල් බැර කිරීම__
__......................................__

1. ඉහත නම සඳහන් මාගේ සම්පූර්ණ මාසික වේතනය 2003 ජනවාරි මස සිට පහත සඳහන් බැංකු ගිණුම හෝ ගිණුම් වෙත බැර කරන මෙන් අයැදේ.

2. දැනට මගේ වැටුපෙන් බැංකු ගිණුමකට මුදල් බැරවන්නේ ණය මුදලක් සඳහාය / සඳ හා නොවේ. (ණය මුදලක් සඳහා මුදල් බැර වන්නේ නම් ඒ කුමන ගිණුමකට ද යන්න සඳහන් කරන්න). ...........................................................................................

.........................................
අයදුම්කරුගේ අත්සන

__බැංකු කළමණාකරුගේ සහතිකය (පළමුවන බැංකුව)__

ඉහත නම සඳහන් අයගේ ගිණුම් අංකය .....................................................
බැංකුවේ නම සහ පරිගණක සංකේත අංකය .............................................
බැංකු ශාඛාවේ නම සහ පරිගණක සංකේත අංකය .......................................
බැර විය යුතු මුදල .....................................................................................

දිනය .................

.........................................
කළමණාකරු
(බැංකු නිල මුද්‍රාව තැබිය යුතුය)

__බැංකු කළමණාකරුගේ සහතිකය (දෙවන බැංකුව)__

ඉහත නම සඳහන් අයගේ ගිණුම් අංකය .....................................................
බැංකුවේ නම සහ පරිගණක සංකේත අංකය .............................................
බැංකු ශාඛාවේ නම සහ පරිගණක සංකේත අංකය .......................................
බැර විය යුතු මුදල .....................................................................................

දිනය .................

.........................................
කළමණාකරු
(බැංකු නිල මුද්‍රාව තැබිය යුතුය)

__අණදෙන නිළධාරි__

නිර්දේශ කෙරේ/නොකෙරේ

දිනය .................

.........................................

| BANK CODE | BANK NAME | BANK ADDRESS |
|---|---|---|
| 7010 | BANK OF CEYLON | 4, Bank of Ceylon, Colombo 01 |
| 7038 | STANDARD CHARTED BANK | 17, Janadipathi Mawatha, Colombo 01 |
| 7047 | CITY BANK N.A | 65 C. Dharmapala Mawatha, Colombo 07 |
| 7056 | COMMERCIAL BANK | 21, Bristol Street, Colombo 01 |
| 7065 | S.C ANZ GRINDLAYS BANK | 37, York Street, Colombo 01 |
| 7074 | HABIB BANK LTD | 140, 142 2nd Colombo 11 |
| 7083 | HATTON NATIONAL BANK | 10, R.A. De Mel, Colombo 03 |
| 7092 | HONGKONG & SHANGHAI BANK | 24, Sir Baron J Mawatha, Colombo 01 |
| 7108 | INDIAN BANK | 89, 91, 93 Mai Colombo 11 |
| 7117 | INDIAN OVERSEAS BANK | 114, Main Street, Colombo 11 |
| 7135 | PEOPLES BANK | Peoples Bank, Colombo 02 |
| 7144 | STATE BANK OF INDIA | 16, Sir Baron J Mawatha, Colombo 01 |
| 7153 | MASHREQ BANK | 67, Sir Chittampalam Gardiner MW, Colombo 02 |
| 7162 | NATIONS TRUST BANK | 76, York Street, Colombo 01 |
| 7171 | AMERICAN EXPRESS BANK | 104, Dharmapala Mawatha, Colombo 07 |
| 7199 | HABIB BANK AG ZURICH | 149/151, Keyzer Street, Colombo 11 |
| 7205 | DEUTSCHE BANK | 86, Galle Road, Colombo 03 |
| 7214 | NDB BANK | 103 A, Dharmapala Mawatha, Colombo 07 |
| 7269 | MUSLIM COMMERCIAL BANK | 98, Chatham Street, Colombo 01 |
| 7278 | SAMPATH BANK | 110, Sir James Peiris MW, Colombo 01 |
| 7287 | SEYLAN BANK | 90, Galle Road, Colombo 03 |
| 7296 | PUBLIC BANK BERHAD | 324, Galle Road, Colombo 03 |
| 7302 | UNION BANK OF COLOMBO LTD | 03-01, East Tow Echelon Square, Colombo 01 |
| 7311 | PAN ASIA BANK | No 450, Galle Road, Colombo 03 |
| 7454 | NATIONAL MERCANTILE BANK | 411/1, Galle Road, Colombo 03 |